# නිර්මාණ Nirmana

## මිහිරි අතීතය

අතීතය මිහිරි වුව යනු නොහැක පැටි    වියට
වින්ද දේ අපමණය සිත් පුරා සිතු    ලෙසට
පිරිවරා නෑසියන් ගෙවූ ඒ කල්    යසට
නැගේ සිහියට නිබඳ අපමණය විදි    සතුට


පාසලේ පන්සලේ ගම් මැද්දෙ කෙළි    දෙලෙන්
ගත කරපු සමය ඒ සුන්දරව හද    බැතින්
මතක සටහන් දිගේ යන විටදි හිත    දුවන්
දනෙයි හද සනසවන මිහිරි සුව    සහනයන්

ඇතත් අද තනි වෙලා හදවතම ගොලු    වෙලා
දනේ මිහිරක් සිහින් අතීතය සිහි    වෙලා
සිහින වැල් තුලින් ඒ අතීතයෙ    කිමිදිලා
ලබන සැප සතුට මගෙ ජීවිතය එළි    කළා

ගලා ගොස් ජීවිතය අන්තයට හරි    ළඟයි
සැප සතුට මවා දෙන අතීතය    සුන්දරයි
සැමරුමෙන් අතීතය වත්මනේ පල    ලබයි
සැප සතුට හදවතට ගෙනෙන මග ඒ    තමයි

♦ මධුරි අබේවික්‍රම
Harrow UK

## ඇය ඔහුට ලියූ කවි - 5
## Poetry she wrote to him - 5



සියපත් අගින් විසිරුණු පිණි පොද    ඔන්න
ඔබ සිහිවෙලා කඳුලක් දිලෙනා    වැන්න
තබනා තොලග රස මී තෙපුලක්    වැන්න
සුවඳක් අරන් එනවද මඳනල    වැන්න

සීතල දුරුත්තේ පෑයූ සඳ    වතියේ
පැහැබර ඔබේ රුව දැකුමින් හරි    හරියේ
කෝමල ලෙසින් පෑ මඳහස මන    ලොලියේ
මා හැර නොයන් හැමදාමත් මා    තනියේ

ළා පැහැ එළිය තුරු සෙවනැලි මවන    විට
ළා දළු නටන මඳ නල ඇඟ වැදෙන    විට
ළා පිණි පොකුරු වැස්සට හිස තෙමෙන    විට
ළා පැහැ දෙතොල් ඔබෙ උණුසුම දැනෙයි    මට

සිහිවන විටදි ඔබෙ සුන්දර සිනහ    කට
දුවගෙන ඇවිත් සිපගන්නට සිතෙයි    මට
ආදර සුසුම උණුසුමෙ හද තොටිල්    ලට
නැත මට ඉඩක් ඔබගේ ඔය කැදැල්    ලට

දහසක් දනන් අතරේ සිටියත්    නිතර
සිත දුක බිඳක්වත් වියැකෙනු නැත    මිතුර
ගත සිත ගිලන් වන බව දැනෙනා    අතර
ඔබ ළඟ මිසක් ඔසු නැත වෙදනන්    අතර

(අඥාතයි) Anon - x x x

## වත්මන් ලෝකය

ලොව හැම දෙයම දැන් ඇත්තේ කණ    පිටය
ඒ හා සමග පරිසරයද කණ    පිටය
බුදු හිමි දෙසූ බණ බොරු නොව සැබ    වටය
එය දැනෙනුයේ එන දෙදහස් දොළ    හටය

රට රටවල් නොසිතු ලෙස වැනසෙන්    නේය
බියකරු විලාසෙන් ලේ වැගිරෙන්    නේය
දස දහසින් මිනිසුන් බිලිගන්    නේය
එහෙනම් ලොව විනාසය මේ වන්    නේය




## නිදහස් උදාන !

හිරවී වහල් බැමිවල අදිරද    වාදී
ජාතිය මගේ ගැතිකම් කළ යුග    යේදී
දියවුණු සුවඳ මුසුවී වෙනතක    නෑදී
මුළු රට නිවයි අද නිදහස් ගහ    සෑදී

අපගේ මුතුන් මිත්තන් නිදහස    පිණිස
වැගුරූ ලෙයින් පණගැන්වූ පෙර    දවස
නව පරපුරේ හදවත් අතරට    පිවිස
නිදහස පිපුණි උතුරද්දී පුන්    කලස

මගෙ රට එයින් පිබිදී ඉදිරියට    යන
නැත අදහසක් අම්බලමක නතර    වන
හැම දෙය අපේ යයි කිවහැකි දිනය    ගැන
ලක්මව සිටියි විමසිල්ලෙන් ඇහිලි    ගැණ

ඉර හඳ සදා පෙරගිරගින් නැගේ    මය
නිදහස් එළිය ඉනි විහිදන අගේ    මය
මගෙ රට මගේ දැය මගෙ බස මගේ    මය
උරුමය උතුම් සිරිලක් අම්මගේ    මය

♦ කිවිපති යටියන පුෂ්පකුමාර
Sri Lanka

## මිතුරු වියොව

යුග දිවිය ඇරඹූ දා පැමිණි පිරිවර අතර
මිතුරු ඔබ තිදෙන විත් ලැගුම්ගති අප සමග
සොම්නසින් සිත් පිරී එකමුතුව නිවසෙ සැම
එදා සිට බෝ කලක් දෙව්ලොවක් විය නිවස

දෙමාපිය කිරුළ ලැබ පිරිස වැඩිවන අතර
ලක්ෂමී අප අතැර ගියා පැන පැළ දොර
සිහිති සුරතල් හඬට ලොබ බැන්ද සරසවිය
හා සමග සිදේවි නැවතුණා අප සමග

පෘතග්ජන දිවිපෙවතෙ නේකවිධ ගැටුම් මැද
ගලාගිය ජීවිතය ගහක් ලෙස ඉදිරියට
හිත මිතුරු ඔබ දෙදෙන පලායති යන බියට
වෙර දැරූ නිසා මම සතුට රැඳුණා නිතර

අද දිනේ දරුවන්ද ලේලි බෑනා සමග
අරඹලා තරඟයක් ජීවිතේ ජය නොදෙන
එය නොරිස්සූ මිතුරු සිදේවි - සරසවිය
ගොසින් ඇත පැල දොර
පසුකරන් වැටත් පැන

♦ ප්‍රදීපා වික්‍රමසිංහ
London SW19

උගතුන් කියා ඇත ලොව වැනසෙන    බවට
බුදුහිමි දෙසූයේ එය බොහොකල්    එපිට
දැන් දැන් එහි ඇත්ත වැටහෙනවා    අපට
පස් පව් වැඩි නිසා ලොව යයි අගා    දෙට

ඇසුවද මෙයට ඉහතින් මෙබඳු කර    දර
දෙදහස් පන්සීය අප සැමරූ    අයුර
මතකය තුළට එයි වී හද බැතිනි    බර
සිත සැනසෙන්ට ඇත ඒ දවසෙහි    මිහිර

බුදුබණ ගණන් නොගනිත් තඹ සතේ    කට
වැරදුණු විටදි දෙවියන් සිහිවෙයි    සිතට
කහවණු මිසක යහගුණ නැත මිනි    සුන්ට
මිය යන විටදි දහලයි පින් කිරී    මට

♦ එස්. කංකානම්ගේ
කැකණදුර මාතර
Sri Lanka

## ජයතු ! ජයතු ! අප සිරිලංකා !

නී ති රීති කාටත් එක වාගෙය
දැන් නැත අප අතරේ    තැවුලක්
කඳාති වරුන් ලෙස සුහදව එකතුව
බැඳගනිමින් සමගියෙ    හවුලක්
ජා ති බේද නැත, පන්ති බේද නැත
සිරිලංකාවම එක    පවුලක්
පී ති පමෝදෙන් රට ගොඩනැගුමට
එක්වෙමු අද නැත කිසි    අවුලක්

වික් මය පෙන්වා නිවහල්කළ මේ
මොහොතේ දෙස බස වගෙම දැයත්
ද ක් වා මවකට තියෙන සෙනේහය
අවියත් වාගෙම පිරිස    වියත්
ලක් බිම මව්බිම ගොඩ අරගන්නට
හැඟීමකින් හද පිරුණු    සියත්
එක් විය යුතු කාලය එළඹී ඇත
රටින් පිටව ගොස් සිටින    අයත්

ති බේ ඔබට මට නිදහස් සිතිවිලි
කවුරුත් ආසා හොඳ    දේටයි
අ බේ ද වී අපි එකට එකතුවෙමු
සතුට සැපත එක්වුණු    දාටයි
ලැබේ එවිට සාමය හා හොඳ හිත
කණගාටුව එය නැතු    වාටයි
ඔ බේ ඇහෙත් ලේ, මගේ ඇහෙත් ලේ,
කාගෙත් ලේ ටික එක    පාටයි

විකා රයෙන් දුම් මත්පැන් අරගෙන
පළිගන්නට මෙන් නොයිඳ    කිපී
අකා ලයට කාලයට ඔබින දේ
තෝරා ඇති විදියකට    යැපී
එකා කාර ලෙස කවුරුත් සමගිව
හැම බිම් අහලම වවමු    අපී
මකා පුරන් කෙත කුඹුරෙ යතොත්
වී කරල් වදියි ඔබෙ දෙපයෙ    හැපී

දස් කම් පා ජනපති හෙවණේ
රණවිරුවන් නැතිකොට අරා    ජිතේ
විස් මිත විදියට යුදබිය දුරුකොට
නැති කළ සැක බිය තිබූ    හිතේ
තිස් වසරක් අප ගිනිගෙන හිටියට
හැදෙන වැඩෙන අද අපේ    අතේ
වස් දොස් දුරුකොට ගොඩනැංවිය යුතු
දරු පැටවුන්ගේ අනා    ගතේ

තුඩ තුඩ මතුකොට අවංක දෑ පෙම
සදහට නැතිකොට හොර    වංකා
වැ ඩ දායක ලෙස පුනරුදයක් ලැබ
සදහට නැතිවී බිය    සංකා
ලෙ ඩ දුක නැතිවී සුවසෙත පැතිරී
කැරකී නිදහස් ජය    පංකා
ගොඩ මඩ සරුවී ගුණ දම් මතුවී
ජයතු ජයතු අපෙ සිරි    ලංකා!

♦ කිවිපති පාතකඩ කුලතිලක
Maharagama Sri Lanka

## The Image of My Conscience

My conscience is before my lifeless body
Place to be seen in a glass cubicle
Coloured and paled and far from steady
And changing rapidly as a melting icicle.

My life had been full of anger,
hatred, ill will and vanity
Besides ego, lust, jealousy and
greed with no tolerance
The immoral attributes commanded
with no dignity
Stark contrast from loving tender care
with compassion and patience.

My conscience is now repenting
for being absent from reality
Having wasted the precious life
at my past Birth
Yet if I could learn how to live
at present with equanimity
I would be able to get out of misery
at my next Birth.

♦ Jayantha Wewelwala
London NW9

## මහිම් සඳ

තිගැස්සී ඇහැරී බලන
මුවැත්තී මමයි නුඹේ
මලක් සේ පිණි විසුළ
සැහව ගිය වත කමල

සොරෙන් මට නොකියාම
සෙමෙන් බැස ගිය සඳසේ
වියරු රුදු රළ පතරෙ
සැහව ගියෙ කෙලෙසින්ද?

♦ ධම්මි විජේසිංහ
Canada

## සුළඟ සේ ඇවිත් ගියා !

සුළඟ සේ ඇවිදින්
වහා පිටව ගිය හැටි
වචනයක් හෝ නොකියා
දෙවොංදරා සං වගේ !
නොගොස් එන්නට බැරිය
නාවොත් යන්නට බැරිය
ලොව ඇත්තේ
යාම් ර්ම් දෙක පමණි!

♦ Daren
London NW 3

## දොර දොර කොඩිවැල්

නිදහස් මල් සුවඳයි පැතිරෙන්    නේ
අදහස් තුළ ගුණයකි පවතින්    නේ
උදහස් නැති ජාතිය විලසින්    නේ
මදහස් මුව පෙන්වමු සතුටින්    නේ

පෙර නරවිරුවන් රට රැක    ගත්තේ
කරදර මැද බව පැවසිය    යුත්තේ
වෙර වීරිය බලයෙනි ජය    ගත්තේ
දොර දොර කොඩිවැල්මය බැඳ    ඇත්තේ

උතුර දකුණ කාටත් පොදු    දෙයකී
මිතුරු වෙමින් වැඩ කළ යුතු    රටකී
රුදුරු බවින් සැම විටකම    වැළකී
සොඳුරු රටක් ඉදිකෙරුවොත්    යෙහෙකී

♦ නිකදළුපොත
කරුණාදාස සපුතන්ත්‍රී
Sri Lanka

## මදුරු දැල සහ මදුරු දළ

සුධා ධවල පැහැ අලස මදුරු දැල
වටකර යහනත පවුරක් සාදත
විසැති මදුරු දළ දුරලා ඈතට
නිදි සුව අළලා සතපයි ගත සිත

සිහින රඳන පවුරක් වුව ඔද තෙද
හිරු අබිමුව සවි සිඳ සුද වියැකෙත
සිහින සමග දැල හකුළා ඉවතට
විස ඇති ලොව හා යා විය යුතු වෙත

♦ උදේනි සිරිමාන්න
පිළියන්දල Sri Lanka

## මාවතේ පුතු

අන්ධ වී ආලයෙන් වින්ද තහනම්    රසේ
බරක් වී පිළිකුල්ව නුඹ ජනිතවිය    කුසේ
ශාප දෙස් දෙවොල් මැද
කල එළඹදස    මසේ
බිහිවුණේ ලෝකයගෙ පිළිලයක් වී    ඇසේ

මවෙකු නැත පියෙකු නැත
ගමක් නමකුත්    නැතේ
ගහක් යට පදික වේදිකාවක    මාවතේ
බඩපොත්ත හකුලවා සුදුමැලිව    හාමතේ
කිරි සිනහ පාන්නේ ඉල්ලමින්    ජීවිතේ

♦ කුමාරි මාම්පිටිය
Abu Dhabi - UAE

## පතිනි

විඳ දරණ කම්කටොළු
උනා පසෙකින්    තබන
තුරුණු විය රියෙ සේ
යළි මතක්කර    දෙමින
හිඳ ළඟින් නොසෙල් වී
ජායාව සේ    රකින
නුඹ නොමැති දා කුමට
තනිව මේ දිවි    ගමන

♦ අශෝක විසිදාගම
Milton Keynes UK



## වික්ටෝරියා පාක්

අන්න ! පෙම්වත!
ගාඩ්වරු එති....
වහා සඟවනු
මැනවි,
බර අවි!

♦ රුවන් බන්දුජීව
Sri Lanka